පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
| --- |
| 09 |

# තෙවන වාර පරීක්ෂණය - 2023

විෂයය :- සිංහල භාෂාව හා සාහිත්‍යය-I ,II

පාසලේ නම : ..............................................................................

ඇතුළත්වීමේ අංකය : ..............................

කාලය : පැය 2යි.

## 1 කොටස

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 20 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. අන් අයගේ වැඩ කටයුතුවලට **<u>අකුල් හෙළීම</u>** ඇතැමුන්ගේ සිරිතකි.

1. එකට එක කිරීම 2. බාධා කිරීම 3. කැලෑ එළි කිරීම 4. අනුබල දීම

02. ගෙදරින් ලිපියක් ලැබෙන තුරු <u>ඇඟිලි ගැනීම</u> මාධවගේ සිරිතය.

1. ඇඟිලිවලින් ඔබා බැලීම 2. අතේ ඇඟිලි ගණන් කිරීම
3. නොඉවසිල්ලෙන් බලා සිටීම 4. ඉවසීමෙන් බලා සිටීම

03. අකාරාදි පිළිවෙළ අනුව නිවැරදිව පෙළ ගැස් වූ පේළිය තෝරන්න.

1. අමාවතුර, පූජාවලිය, සද්ධර්මරත්නාවලිය, බුත්සරණ. 2. ප්‍රබුද්ධ, බෝඩිම, ව්‍යාංගා, නොමියෙමි
3. අඹ යාළුවෝ, ශිෂ්‍යත්වය, තුංමං හන්දිය, මනෝමන්දිර 4. කඳා වළලු, මනමේ, මහාසාර, සිංහබාහු

04. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.

1. කණිෂ්ඨ, නිර්වාන, ලේකම්, මර්දනය 2. කැලණි. පිළියෙල, විශිෂ්ට, පරිගණකය
3. නිශ්පාදන, සමස්ත, පිළිතුරු, ලේකන 4. දුශ්කර, ශිස්ඨාචාරය, ප්‍රාශ්වාස, විශ

05. මූර්ධජ අක්ෂරයක් ඇතුළත් නොවන වචනය වන්නේ,

1. ආරුඪ 2. සංඛ්‍යාව 3. පණිවිඩය 4. පීඨය

06. “රන්” යන පදයට සමානාර්ථ පදය වන්නේ,

1. කසුන් 2. තරිඳු 3. සින්ධු 4. පසිඳු

07. විරුද්ධාර්ථ පද යෙදී ඇති වරණය තෝරන්න.

1. යෝග - වියෝග 2. සිසි - සොමි 3. පිසිඳු - පරසිඳු 4. ආනන්දය - අමන්දානන්දය

08. උක්ත පද දෙකක් හා අනුක්ත පදයක් යෙදී ඇති පිළිතුර තෝරන්න.

1. ගුරුවරයෙක්, ළමයි, රීතිහු 2. මා, තොප, ඔවුහු
3. අපි, මිනිසෙක්, ඔවුන් 4. දැරියන්, මවක්, මිනිසුන්

- පහත සඳහන් පද්‍යා පාඨවල හිස්තැන් පිරවීමට සුදුසු නිපාත පද තෝරන්න.

09. “කිම් ............. මැණියනි ඔබ මේ පවසන වදනා...”

1. තෙක් 2. ද 3. සේ 4. ගෙන්

10. ................ නිරිඳුගේ රැකවලෙහි නියුත්තෝ

1. නිති 2. හෝ 3. ද 4. මිස

11. ප්‍රයෝජ්‍ය ක්‍රියා පදයක් යෙදී ඇති වරණය තෝරන්න.

1. නැන්දා ඇඳුම් මසා හැඩ බැලුවාය. 2. ගුරුවරු ළමයින් ලවා අකුරු ලියවති.

3. අහස ගොරවද්දී තාත්තා ගෙදර ආවේය. 4. පඬිවරු අගනා පොතපත ලියති.

12. “<u>වළඳින අඳහසින් මෙන් සුරගඟ අඟන</u>

නලබල සසල දළ රළ පෙළ නුබ නැගෙන ". ”ඉරි ඇඳි පදයේ කාව්‍යාලංකාරය වන්නේ,

1.රූපකාලංකාරය 2. උපමාලංකාරය 3. අනුප්‍රාසය 4. එළිසමය

13. පූර්ව ක්‍රියා පද දෙකක් එකතු වීමෙන් සැකසුණු යුගල පද ඇතුළත් පිළිතුර වන්නේ,

1. ගේ දොර, එහෙ මෙහෙ, නඩු හබ 2. කවා පොවා, කා බී, කර කියා

3. දුවන පනින, නැටිලි ගැයිලි, අබල දුබල 4. එහෙ මෙහෙ, කන බොන, හරකා බාන

- පහත දක්වා ඇති වාක්‍යවල හිස්තැනට සුදුසු පදය තෝරන්න.

14. පන්තියෙන් ................................ නැඟී සිටියේය.

1. අයෙක් 2. ඇතැමෙකු 3. එක් අයෙක් 4. එක් අයෙකු

15. සියොත් කැල අහසේ .............................

1. පියාඹයි. 2. පියාඹති. 3. පියාඹුවාය. 4. පියාඹුවේය.

16. නිවැරදි වාක්‍ය තෝරන්න.

1. ළමයි විසින් මිතුරෝ ඇසුරු කරනු ලබයි. 2. ළමයා විසින් මිතුරන් ඇසුරු කරනු ලබති.

3. ළමයින් විසින් මිතුරෝ ඇසුරු කරනු ලබති. 4. ළමයින් මිතුරෝ ඇසුරු කරනු ලබති.

17. “දැසේ නිල් පැහැය දැවී සෙමෙන් තුරන් විය” යන යෙදුමේ නාම විශේෂණ පදය වන්නේ,

1. දෑස 2. සෙමෙන් 3. පැහැය 4. නිල්

18. නිවැරදිව පද බෙදා ලියා ඇති වාක්‍ය තෝරන්න.

1. ඔහු ත් මම ත් තරගයට සහභාගි වෙමු.

2. නිරතුරුව කුසල් රැස් කරමු.

3. බල ව අනුරාපුර හා පොළොන්නරු වැව් සයුරු වල අපූරුව!

4. කර ව පියාසර සකිකොන්තගංතොටින්

19. ධීවර භාෂාවේදී ‘කෝඩය’ යනුවෙන් හැඳින්වෙන්නේ,

1. අහස ගෙරවීමයි 2. වර්ෂාවයි 3. මුහුදු රළ සැඩවීමයි 4. මුහුදු රළයි.

20. “ මල් මල් වාරම් හරි මැ උදාරම්” ගීතයේ රචකයා වන්නේ,

1. සුනිල් ශාන්ත 2. සුනිල් සරත් පෙරේරා 3. එස්. මහින්ද හිමි 4. කැලිස්ටස් ජයසිංහ

(ලකුණු 2×20=40)

## 11 කොටස

1. පහත සඳහන් විස්තර කියවා ඉන් එකක් තෝරා ගෙන වචන 200කට නොඅඩු රචනාවක් ලියන්න. ඔබේ රචනාවට සුදුසු මාතෘකාවක් ද යොදන්න.

අ) විද්‍යුත් මාධ්‍යන්ගේ ව්‍යාප්තියක් සමඟ පාසල් සිසුන් පවා පොතපත කියවීමෙන් ඈත් වී ඇත. පොතපත කියවීම යහ පුරුද්දකි.

ආ) මිනිසා විවිධ කාර්යයන් සඳහා ජලය ප්‍රයෝජනයට ගන්නා අතර බීමට ගැනීම එයින් ප්‍රධාන වේ. රටක පැවත්මට නිරෝගී ජනතාවක් සිටීම වැදගත් වන නිසා ජල සම්පත ආරක්ෂා කිරීම වඩාත් වැදගත් වේ.

ඇ) ජනාකීර්ණ ප්‍රදේශවල පමණක් නොව වැව්, කැළෑ, උද්‍යාන ආදි ස්ථානවලත් කැලි කසළ තැන තැන දමා අශෝභන දර්ශනයක් මවා ඇත්තේ මිනිසුන්මය. එය පරිසරයේ තිරසාර පැවතීමට බාධකයකි. මිනිසා මේ ආකාරයෙන් අවිධිමත් ලෙස කසළ බැහැර කිරීම අද ප්‍රබල ගැටලුවක් බවට පත්ව ඇත.

ඇ) මත්ද්‍රව්‍ය භාවිතය සමස්ත සමාජයටම බලපාන ඛේදවාචයකි. මත්ද්‍රව්‍ය නිසා පුද්ගලයන් මානසික වශයෙන් පමණක් නොව ශාරීරික වශයෙන් ද පිරිහෙයි. වර්තමානයේ සිසු පරපුර ද ටිකෙන් ටික ගිලගන්නා මත්ද්‍රව්‍ය බොහෝ අපරාධවලට හේතු වී ඇත.

(ලකුණු 20 යි)

2. පහත සඳහන් ගද්‍ය පද්‍ය පාඨ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

i. " එසේ වී නම් මාත් ඒ බොන්නට වුව මැනැ වැ' යි"

අ. මෙම පාඨය ඇතුළත් පාඩමේ නම ලියන්න.

ආ. මෙසේ පැවසුවේ කවුද ?

ඇ. මෙම පාඩම ඇතුළත් මුල් කෘතියේ රචකයා කවුද ?

ii. " සිත් සේ වැඳ පුදා ගනු මැන වැ"

අ. ඉහත පාඨය ඇතුළත් පාඩමේ නම ලියන්න.

ආ. ඉහත ප්‍රකාශය සිදු කළ තැනැත්තා පසුව සිදුකළේ කුමක් ද?

ඇ. මෙම පාඨය සඳහන් ජන කතාව උපුටාගත් කෘතිය කුමක් ද?

iii. " හොඳයි, තමුන්නාන්සේ ඕනෑ කෙංගෙඩියක් කරන්නට කාරි නෑ"

අ. ඉහත පාඨය උපුටාගත් කෙටිකතාව කුමක් ද?

ආ. එහි රචකයා කවු ද ?

ඇ. මෙම කෙටිකතාව රචනා කර ඇති දෘෂ්ටිකෝණය කුමක් ද?

iv. " මේ මිනිහා මහ මෝඩයෙක් නේ. අහල කිසි දෙයක් දැනගන්න බෑ"

අ. මෙය කාගේ ප්‍රකාශයක් ද?

ආ. ඉහත පාඨය උපුටාගත් පාඩමේ නම ලියන්න.

ඇ. මෙම පාඨය ඇතුළත් නිර්මාණයේ රචකයා කවු ද ?

v. පෙර දැක නොමැති මුත් සුන්දරහාමි විසින්
මගේ තොරතුරු ඇසූ සැටි හිතවතකු ලෙසින්
ගෙඩියක් කඩාගෙන ගෙමිදුල තැඹිලි ගසින්
..........................................................................

අ. ඉහත කවියේ රචකයා කවු ද?

ආ. ඉහත කවියේ අවසන් පාදය සම්පූර්ණ කරන්න.

ඇ. ඉහත කවියෙන් පෙන්වා දෙන සාරධර්මය කුමක් ද? (ලකුණු 15 යි)

3. පහත දැක්වෙන පද්‍ය ඇසුරෙන් අසා ඇති ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

බන්දා විජය දද අකනිට පද හිමිමේ
සින්දා හළ එතෙක් රිපු සිරිලක් අම්මේ
අන්දා ඔබගේ සිතයම හද මිණි බැම්මේ
වැන්දා මෙන්න මුදුනත් නගමින් දැම්මේ

කරුණා මහිම කොයි තරම ද කිවොත් ඔබේ
මැවුණා මහා ගංගාවල් ලෙසින් ඉබේ
ඉනුණා බසින දියරක් තැවරුණොත් මොඹේ
මරණාසන්න හුස්මට මුන් ආසි ලැබේ

i. අතීතයේ ලංකාව අභිමානයෙන් බැබලුනු රටක් බව කියාපන කවි පදය කුමක් ද?

ii. කවියේ සඳහන් පරිදි සිරිලක් මව කරුණාව පෙන්වා ඇත්තේ කෙසේ ද?

iii. කවියා මෙරටෙහි පවතින ජල සම්පත වර්ණනා කර ඇත්තේ කෙසේ ද?

iv. මෙහි දැක්වෙන අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියාපදයක් ලියන්න.

v. පහත යෙදුම්වලට සමාන සුදුසු පද පද්‍ය කොටසින් තෝරා ලියන්න.

(අ) කොඩි (ආ) මැණික් (ලකුණු 10 යි)

4. පුස්තකාලයට අවශ්‍ය කරන පොත්පත් මිල දී ගැනීම සඳහා මිල ගණන් විශේෂ වට්ටම් පොත් නාමාවලිය පිළිබඳව දන්වා එවන ලෙස ඉල්ලමින් ඔබ පාසලේ පුස්තකාල සංගමයේ ලේකම් යැයි සිතා කොළඹ 11, ඕල්කට් මාවතේ පිහිටි ගුණසේන සමාගමේ කළමනාකරුට යැවීමට සුදුසු ලිපියක් ලියන්න.

**නැතහොත්**

**පහත සඳහන් ඡේදය වචන 25 –- 30 අතර වන සේ සාරංශ කර ලියන්න. ඔබ ලියූ සාරංශය අවසානයේ වචන සංඛ්‍යාව ලියන්න.**

ළමා සාහිත්‍යයේ වස්තු විෂය ගහකොළ,සතුන් ආදි අවට පරිසරය,ස්වභාවික වස්තු එදිනෙදා ජීවන අද්දැකීම්, විවිධ පුද්ගලයන්,සුරංගනාවන්,රාක්ෂසයන් ආදි පුළුල් ක්ෂේත්‍රයක පැතිර පවතී. ස්වභාව ධර්මයේ විවිධ සංසිද්ධි ද ළමා සාහිත්‍ය නිර්මාණයේ දී ප්‍රබල වස්තු විෂය බවට පත් වෙයි. පරිසරය හා ළමයා අතර සබඳතාව ගොඩ නැංවීමේ ලා ළමා සාහිත්‍යයේ කාර්යභාරය සුවිශේෂී වේ. පරිසරයේ අන්‍ය වස්තූන් තමා හා සමානව සැලකීමට ළමයා පොළඹවන සාහිත්‍ය නිර්මාණ ළමයා පරිසරයට ආදරය කරන මිනිසකු බවට පත් කරයි. පරිසරයට පමණක් නොව තමා උපන් බිමට හිතැති පුරවැසියෙකු සේ ළමයාගේ පෞරුෂය වර්ධනය කිරීමට ළමා සාහිත්‍යයේ දායකත්වය වැදගත් වේ.

(ලකුණු 15 යි)